## සැලැස්මට සම්බන්ධ අනෙකුත් තොරතුරු

- ඇතුලත්වීමේ වයස අවු 18 - 65 දක්වා කල්පිරීමේ වයස අවු 70 නොඉක්මවිය යුතුය.
- සැලසුම් කාලසීමාව අවු 5 - 40.
- අවම වාර්ෂික මූලික වාරිකය රු 6000.
- අවම තනි වාරිකය රු 15000.

## සැලසුම බල රහිත වුවහොත් සිදුවන්නේ කුමක්ද ?

පළමු වසර 3 ඇතුලත ඔබ විසින් ඔබගේ වාරික දින 30 ක සහන කාල සීමාව තුල නියමිත පරිදි ගෙවනු නොලැබූ විටක දී සැලසුම බලරහිත වන අතර ඔබ වෙත ප්‍රතිලාභයක් හිමි නොවනු ඇත. කෙසේ වුවද කොන්දේසි වලට යටත්ව සැලසුම නැවත බලගැන්වීමේ අවස්ථාව ඔබට හිමිවේ.

ඔබ විසින් වසර 3 ක් හෝ ඊට වැඩි කාලයක් වාරික නිසිපරිදි ගෙවමින් සැලසුම පවත්වා ගෙනගොස් ඇත්නම් අත්‍යවශ්‍ය අවස්ථාවක දී සැලසුම මුදල් බවට පත්කර ගැනීමේ හැකියාව ඔබට හිමිවේ. කෙසේ වුවද සැලසුම සැලකියයුතු පවාරන ගාස්තුවකට යටත්වන අතර එම ගාස්තුව සැලසුම සැලසුම පවත්වාගෙන ගොස් ඇති කාල සීමාව අනුව වෙනස් වේ.විකල්පයක් වශයෙන් ජීවිතාවරණ ප්‍රතිලාභ රහිතව ඔබේ අරමුදල වර්ධනය වීමට ඉඩහරිමින් කල්පිරීමේ වැඩි වටිනාකමක් ලබා ගැනීමට ද ඔබට හැකි වේ.

# සණස ජීවිත ආයෝජන



## අමතන්න
## 011 200 2021

සණස රක්ෂණ සමාගම

340 2/1, ආර් . ඒ . ද මෙල් මාවත , කොළඹ 03

සණස රක්ෂණ සමාගම

අප සියළුදෙනා සතු සිහින හා අපේක්ෂාවන් රාශියකි. එම සිහින සැබෑ කරගැනීම සඳහා අපි බැංකු ඉතුරුම් ගිණුම්, ස්ථාවර තැන්පතු වැනි සාම්ප්‍රදායික ඉතුරුම් ක්‍රම අනුගමනය කිරීම සාමාන්‍ය සිරිතයි. කෙසේවුවත්, ඉහත ඉතුරුම් ක්‍රම මඟින් ඇතැම්විට අප බලාපොරොත්තු වූ අපේක්ෂාවන් එලෙසින්ම හිමිනොවීමටද ඉඩ ඇත .

සණස ජීවිත ආයෝජන සැලැස්ම මඟින් ඔබට වඩාත්ම උචිත ආයෝජන ක්‍රමවේදයක් තෝරාගැනීමේ අවස්ථාව හිමිවේ. එමඟින් ඔබේ ආයෝජනයට උපරිම ප්‍රතිලාභ හිමිකර ගැනීමේ අවස්ථාව ඔබ සතුය. එපමනක් නොව ඔබට හා ඔබේ ආදරණීයන් වෙත ජීවිත රක්ෂණ ප්‍රතිලාභ රැසක් හිමිකර දීමෙන් ඔබේ සිහින හා අපේක්ෂාවන් වඩාත් සුරක්ෂිත කරයි.

## සණස ජීවිත ආයෝජන සැලැස්මේ ඇති විශේෂත්වයන්

කල්පිරීමේ දී බදු වලින් නිදහස් ඉතුරුම් අරමුදලක්.

ඔබටම ගැලපෙන ජීවිත ආවරණයක්.

ඔබ නැතත් ඔබගේ පවුලේ මාසික ආදායම සුරක්ෂිත කිරීමේ හැකියාව.

ඔබේ ඉතුරුම් උද්ධමනයේ අහිතකර බලපෑමෙන් සුරක්ෂිත කිරීමේ හැකියාව.

ඔබ ඔබගේ කලත්‍රයා හා ඔබගෙ දරුවන් සුරක්ෂිත කිරීම සඳහා අතිරේක ප්‍රතිලාභ රැසක්.

අමතර සෞඛ්‍ය සහ රැකවරණ ප්‍රතිලාභයන් මඟින් රෝහල් ගතවීම්, බරපතල රෝගාබාධ සහ සැත්කම් ද ආවරණය වේ.

# සණස ජීවිත ආයෝජන

## ඔබගෙ ඉතුරුම් අරමුදල ගොඩනැගෙන ආකාරය

මේ වර්ෂයේ දී ඔබේ වයස අවු 30 නම්, වසර 15 ක සැලසුමක් තෝරාගත්තේ නම්, ඔබෙ ඉතුරුම් අරමුදලේ ප්‍රක්ෂේපිත වටිනාකම් පහත පරිදි වනු ඇත.

| වාර්ෂික මූලික වාරිකය | ප්‍රක්ෂේපිත ඉතුරුම් අරමුදල | | |
|---|---|---|---|
| | 8% වාර්ෂික | 10% වාර්ෂික | 12% වාර්ෂික |
| 100 000 | 2 368 945 | 2 781 650 | 3 273 015 |
| 200 000 | 4 680 746 | 5 499 723 | 6 473 588 |

ශ්‍රී ල රු

ඉහත ප්‍රක්ෂේපිත වටිනාකම් හුදෙක් නිදර්ශනයක් වන බව සලකන්න. මෙහි දක්වා ඇති ඉපැයීම් අනුපාතයන් වාර්ෂිකව වෙනස් වේ එමෙන්ම මෙම අනුපාතයන් ඔබට ලැබිය හැකි ඉහලම හෝ පහළම අනුපාතයන් නොවේ. කල්පිරීමේදී ඔබට ලැබෙනුයේ ඔබේ අරමුදලේ වටිනාකම වේ.

## සණස ආයෝජන සැලැස්ම සඳහා වන අමතර ප්‍රතිලාභ

### අතිරේක ජීවිත රක්ෂණ ප්‍රතිලාභ

සුළු මුදලක් අමතරව ගෙවීමෙන් මූලික ජීවිතාවරණය වැඩිකර ගත හැකිය. මෙයින් ඔබෙ පවුලේ සුරක්ෂිතභාවය වඩාත් තහවුරුවේ.

### හදිසි අනතුරු ප්‍රතිලාභය

හදිසි අනතුරකින් සිදුවන වියෝවක දී ඔබේ යැපෙන්නන් හට මෙයින් වැඩි රැකවරණයක් හිමි වේ. එයට අමතරව ඔබට පූර්ණ නිත්‍ය අකර්මන්‍යතාවයකට මුහුණ දීමට සිදුවුවහොත් මූල්‍යමය රැකවරණ මෙයින් සැලසෙනු ඇත.

### රෝහල් ගතවීමේ ප්‍රතිලාභය

ඔබ දින 3 කට වඩා රෝහල් ගතවී සිටියේ නම් සෑම දිනකටම (ඇතුලත් කල දිනයේ සිටම) රු 10,000 ක උපරිමයක් දක්වා මුදල් ලබා දේ. දැඩිසත්කාර ඒකකයට ඇතුලත් කලහොත්, ලැබෙන එම මුදල දෙගුණවේ.

### බරපතල රෝග ආවරණය

සැලසුමේ නිර්වචනය පරිදි බරපතල රොගී අවස්ථාවකදී ඔබට හා ඔබගේ කලත්‍රයාට මූල්‍යමය ආධාර ලබාදෙයි.

### අවමංගල්‍යාධාර වියදම්